ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2017 මැයි 19 |

## ඒ එස් ජයවර්ධන මහතාට උපහාරයක් වශයෙන් "ශ්‍රී ලංකාවේ මූල්‍ය සේවා පිළිබඳ මග පෙන්වීමක්" (A Guide to Financial Services in Sri Lanka) යන නව මහ බැංකු ප්‍රකාශනය එළි දක්වයි

ශ්‍රී ලංකාවේ මූල්‍යායතන පිළිබඳ ව පොදු මහජනතාවගේ දැනුම්වත්භාවය උදෙසා විශේෂයෙන් සැකසුණු නවතම මහ බැංකු ප්‍රකාශනය වන "A Guide to Financial Services in Sri Lanka" දැන් නිකුත් වී ඇත. 1995 නොවැම්බර් සිට 2004 ජූනි දක්වා මහ බැංකු අධිපති වූ ඒ. එස්. ජයවර්ධන මහතාට උපහාර පිණිස එළිදැක්වුණු මෙම ප්‍රකාශනය මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති පී. සමරසිරි මහතා විසින් රචනා කොට ඇත. ඒ. එස්. ජයවර්ධන මහතාගේ යෝජනාවක් සහ මග පෙන්වීම යටතේ සමරසිරි මහතා විසින් 2002 වසරේ අප්‍රේල් මාසයේ දී මුල් වරට රචනා කොට නිකුත් කළ මෙම ප්‍රකාශනයේ අරමුණු වූයේ ශ්‍රී ලංකාවේ මූල්‍ය සේවාවන් පිළිබඳ මූලික දැනුමක් පොදු මහජනතාවට ලබා දීමයි.

ශ්‍රී ලංකාවේ පවතින විවිධ මූල්‍ය ආයතන, ඒවායින් මහජනතාවට ලබාගත හැකි සේවාවන්, මහ බැංකුවෙන් බලයලත් විවිධ මූල්‍යායතන පිළිබඳ නාමාවලිය, නියාමනය හා අධීක්ෂණයේ ස්වභාවය, එම ආයතන සමග කෙරෙන මහජන ගනුදෙනුවල සුරක්ෂිතභාවය යනාදිය පිළිබඳ ව ප්‍රයෝජනවත් මූලික කරුණු රාශියක් කියවීමට පහසු සරල බසින් මෙහි ඉදිරිපත් කෙරේ. මෙම ප්‍රකාශනයේ සිංහල හා දෙමළ ප්‍රකාශනයන් ද ළඟදීම එළි දැක්වීමට නියමිත ය.

රු. 50.00කට මිල කර ඇති මෙම ප්‍රකාශනය, කොළඹ 1 චැතැම් වීදියේ සහ රාජගිරියේ මහ බැංකු විදු පියසේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුවේ අලෙවි ප්‍රකාශන අලෙවි කවුළුවලින් සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් දැන් මිල දී ගත හැකි ය.